**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2023 ජුලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

මුළු විෂය නිර්දේශයම ආවරණය වන අයුරින් මෙම කොටස සකස් කර තිබෙන බව පෙනේ. ප්‍රශ්ණ අංක 1.1 සිට 1.10 දක්වා දෙන ලද වරණ වලින් නිවැරදි වරණය තේරීමත් ප්‍රශ්ණ අංක 1.11 සිට 1.12 දක්වා ප්‍රශ්ණ වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තේරීමටත් 1.13 සිට 1.14 ප්‍රශ්ණ වල සත්‍ය අසත්‍ය බව ප්‍රකාශ කිරීමටත් 1.15 සිට 1.20 දක්වා ප්‍රශ්ණ වලට කෙටි පිළිතුරු ලිවීමත් සඳහාත් මෙම කොටස මගින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්ණය යටතේ බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබා තිබුණු අතර, සමහර සිසුන්ගේ පිළිතුරු වල දුර්වලතා තිබුණි. මේ අනුව පොදුවේ දැකිය හැකි දුර්වලතා පහත පරිදි වේ.

1.1 නිෂ්පාදන සාධක සඳහා ගෙවීම් පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්ණයට, එනම් ව්‍යවසායකත්වයට කරන ගෙවීම "ලාභය" ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

1.2 උපේක්ෂා වක්‍ර පිළිබඳ දැනුම විග්‍රහ කිරීමට අසා ඇති මෙම ප්‍රශ්ණයට අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි. බහුතරයක් අයදුම්කරුවන්ගේ උපේක්ෂා වක්‍ර පිළිබඳ දැනුම මඳ බව පෙනේ.

1.3 නම්‍යතාව පිළිබඳ දැනුම විමසීමට අසා තිබූ මෙම ප්‍රශ්ණයට **A** හා **B** අතර වන සම්බන්ධයක් ඇත්තේ ආදේශක භාණ්ඩ සම්බන්ධයෙන් බව හඳුනාගෙන නිවැරදිව උත්තර සපයා තිබුණි.

1.4 සැපයුමේ නම්‍යතාවය පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්ණයට පිළිතුර එකට අඩු අගයක් වන බැවින් අනම්‍ය ඉල්ලුමක් ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

1.5 2022 ආර්ථික වර්ධන වේගය පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්ණයට අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි. ප්‍රායෝගික දැනුම ලබාගැනීමට මහ බැංකු වාර්තාව පරිශීලනය අඩු බව පෙනේ.

1.6 ආර්ථික වර්ධනයේ සෘණාත්මක බලපෑම පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්ණයට අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි.

**1.7** සැපයුම් වක්‍රය දකුණට විතැන් වීම හැඳින්වීමට භාවිතා කරන සංකල්පය 'සැපයුමේ වැඩිවීම' ලෙස බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.8** පූර්ණ තරඟකාරී වෙළඳපොලක ලක්ෂණ පිළිබඳව දැනුම පරීක්ෂා කිරීමට අසා තිබූ මෙම ප්‍රශ්ණයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සැපයීමෙන් පෙනී යන්නේ, ඒ පිළිබඳව ඔවුන්ට මනා දැනුමක් ලැබී ඇති බවයි.

**1.9** මුදලේ කාර්යයන් පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්ණයටද අයදුම්කරුවන් සාර්ථකව, අදාල නොවන කාර්යය ලෙස 'සාපේක්ෂව හිඟවීම' යන්න හඳුනාගෙන තිබීමෙන් පෙනී යන්නේ ඔවුන්ට මුදලේ කාර්යයන් පිළිබඳ දැනුම පරිපූර්ණ බවයි.

**1.10** මුළු සෘජු පිරිවැයට ගෙවූ වේතන, අමුද්‍රව්‍ය මිලට ගැනුම් හා ආර්ථික ක්ෂයවීම් හා වක්‍ර පිරිවැයට ආර්ථික ක්ෂයවීම් හා කැපකළ පොලී ආදායම ගෙන නිවැරදිව මුළු සෘජු පිරිවැය හා මුළු වක්‍ර පිරිවැය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර තිබුණි.

**1.11 - 1.12** යන ප්‍රශ්ණ වලට දී ඇති පිළිතුරු දෙක අතුරින් නිවැරදි පිළිතුර තේරීමට දී තිබූ මෙම ප්‍රශ්ණයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. මෙම ප්‍රශ්න මගින් අසා තිබුණේ සාර්ව හා සූක්ෂ්ම ආර්ථික විද්‍යාව පිළිබඳව සහ ආන්තික පිරිවැය පිළිබඳවයි.

**1.15 - 1.20** දක්වා ගැටළු වලට අයදුම්කරුවන්ට කෙටියෙන් පිළිතුරු සැපයීමට ඉඩ සලසා තිබුණි.

ආර්ථික භාණ්ඩ වල ලක්ෂණ, කතිපයාදිකාරී වෙළඳපොලක ලක්ෂණ, පටු මුදල් හා පුළුල් මුදල් අතර වෙනස්කම් යන ප්‍රශ්ණ වලට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

එහෙත් රටක මුදල් සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක, මිල ඉල්ලුම් නම්‍යතාවේ තීරක හා පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටිකාලයේදී සමතුලිතය ලඟා කරගන්නා ආකාරය පිළිබඳව අසා තිබූ ප්‍රශ්ණ වලට සාර්ථකව පිළිතුරු සැපයීමට නොහැකි වී තිබුණි.

මෙම කොටසට ලකුණු 40 ම ලබාගත් අයදුම්කරුවන් කිහිපදෙනෙකු පමණක් සිටින ලදී.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** වෙළඳපොළ ක්‍රමයේ හා 'සැලසුම්ගත ආර්ථික ක්‍රමය' මගින් මූලික ආර්ථික ප්‍රශ්ණ විසඳා ගන්නා ආකාරය යන ප්‍රශ්ණයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, ඇතැම් අයදුම්කරුවන් විවිධ වෙළඳපොළ ක්‍රම පටලවාගෙන ඇති බවක් දක්නට ලැබුණි.

**(b)** භූමියේ ලක්ෂණ සඳහන් කිරීම බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදුකර තිබුණි. ආර්ථික සම්පතක් වශයෙන් භූමියේ ලක්ෂණ සටහන් කර ඇති නිසා සමහර අයදුම්කරුවන් ආර්ථික භාණ්ඩ වල ලක්ෂණ වැරදි ආකාරයට ලියා තිබුණි.

**(c)** ආර්ථික විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සලකන්නේ ආර්ථික විද්‍යාවෙන් මිනිසා හා සමාජය පිළිබඳව අධ්‍යයනයක් සිදුකරන බවත් එහිදී සමාජය තුළ මිනිසාගේ ආර්ථිකමය පැතිකඩ පිළිබඳව හදාරන බවත් සඳහන් කර බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා වෙන්කර තිබූ ලකුණු ලබාගෙන තිබුණි. තවත් සමහරක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමට ඉදිරිපත් නොවූහ.

## ප්‍රශ්න අංක 03

**(a)** **(i)** බොහෝ අයදුම්කරුවන් සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය නිවැරදිව ගණනය කර මුලු ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත් ඇතැම් අයදුම්කරුවන්ට සමගාමී සමීකරණය නිවැරදිව විසඳීමට නොහැකි විය.

**(ii)** බොහෝ අයදුම්කරුවන් නිශ්පාදන අතිරික්තය නිවැරදි ලෙස ගණනය කර තිබුණේ නැත. අයදුම්කරුවන්ට සැපයුම් සමීකරණයට අනුව නිවැරදි සැපයුම් වක්‍රය ඇඳ ගැනීමේ හැකියාවක් නොමැත. ඒ පිළිබඳ නිසි දැනුම අයදුම්කරුවන් විසින් ලබාගත යුතුව ඇත.

**(b)** සමහර අයදුම්කරුවන් අදාල රූපසටහන හා පැහැදිලි කිරීම නිවැරදිව සිදුකර තිබුණි. එනම් මෙහිදී සහනාධාරය නිසා සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම හා ඉල්ලුම් වක්‍රයේ කිසිඳු වෙනස්වීමකින් තොරව සමතුලිත මිල හා ප්‍රමාණයට කුමක් සිදුවූයේද යන්න හා සහනාධරය නිසා අහිමිවූ සුභසාධනයක් හටගන්නා බව පැහැදිලිව සඳහන් කර තිබුණි.

ඉහල ලකුණු ලබාගත් අයදුම්කරුවන් පවා සහනාධරය නිසා සැපයුම් වක්‍රය දකුණට විතැන්කිරීම වෙනුවට ඉල්ලුම් වක්‍රය වමට විතැන් කර සැපයුම් වක්‍රයට කිසිදු වෙනසක් නොකර වැරදි සහගත පිළිතුරු සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් රූපසටහන නිවැරදිව ඉදිරිපත් කලද එය පැහැදිලි කිරිමට අමතක කර තබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** ශ්‍රී ලංකාවේ උද්ධමනයට හේතු යන ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් කාලීන ආර්ථික තොරතුරු ඇසුරින් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

සමහර අයදුම්කරුවන් ප්‍රායෝගික කරුණු පදනම් කරගෙන පිළිතුරු සපයා තිබුණු අතර සමහර අයදුම්කරුවන් න්‍යායාත්මක පදනමකින් පිළිතුරු සපයා ඇත. කෙසේවෙතත් මේ පවතින උද්ධමනකාරී තත්වය පිළිබඳව අයදුම්කරුවන් තවදුරටත් දැනුවත් වී සිටිය යුතුය.

**(b)** උද්ධමනය අවම කිරීමේ පිළියම් පිළිබඳව අසා තිබුණි. මෙම ප්‍රශ්ණයට අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණද, ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික පරිසරය පදනම් කරගෙන බහුතර පිරිසක් පිළිතුරු සැපයීමට ප්‍රවේශව ඇතත් මුළු ලකුණු ලබාගෙන ඇත්තේ සුළු පිරිසක් පමණි.

**(c)** ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය බලපාන ආකාරය නිවැරදිව පැහැදිලි කොට ඇත්තේ ඉතාම සුළු පිරිසකි. ඉහල පොලී අනුපාතය ආයෝජකයින්ට අවාසි සහගත වන බව සමහර අයදුම්කරුවන් හදුනාගෙන නොතිබුණි. බහුතරයක් අයදුම්කරුවන් පිරිසක් නිවැරදි පිළිතුරු සපයා නොතිබුණි.

**ප්‍රශ්න අංක 05**

**(a)** ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ඇති අයිතම පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්ණයට අයදුම්කරුවන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා තිබුණ ද සමහර අයදුම්කරුවන් මේ සඳහා ගෙවුම් ශේෂ ලේඛනයේ ඇති ගිණුම් වර්ග වැරදි සහගත ලෙස ලියා ඇත. තවද, ඇතමුන්ට මේ පිළිබඳව කිසිඳු දැනුමක් නොමැති බව මනාව පැහැදිලි විය.

**(b)** ආරක්ෂණවාදයට පක්ෂව හා විපක්ෂව තර්ක බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි. ආරක්ෂණවාදය, රටේ සුළු පරිමාණ ව්‍යවසායකයින් ආරක්ෂා කරන බව අයදුම්කරුවන් දැන සිටියහ.

**(c)** ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක සමහර අයදුම්කරුවන් සාර්ථක ලෙස පිළිතුරු වශයෙන් සපයා තිබුණ ද බහුතර පිරිසක් මෙම ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමට ප්‍රවේශ වුවද, සාර්ථකව පිළිතුරු සපයා නොමැත. නූතන ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් වන මෙම අර්ථික ගැටළුව පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අවම මට්ටමක පැවතීම කණගාටුදායක කරුණකි.

මෙම ප්‍රශ්ණයට, මුළු ලකුණු ප්‍රමාණයම ලබාගත්තේ අයදුම්කරුවන්ගෙන් කිහිපදෙනෙකු පමණි.

## <u>C කොටස</u>

**ප්‍රශ්න අංක 06**

**(A)** ව්‍යාපාර චක්‍රයේ අවධීන් ප්‍රසාරණය, මුදුනත, සංකෝචනය හා පතුල ලෙස නම් කර පැහැදිලි කිරීමද බොහෝ අයදුම්කරුවන් නිවැරදිව සිදුකර තිබුණි. සමහර අයදුම්කරුවන් ඉතාමත් නිරවුල්ව රූපසටහනක් ද භාවිතා කර පිළිතුරු සපයා තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් අවධීන් නම් කිරීම පමණක් සිදු කර, පැහැදිලි කිරීමට ප්‍රශ්ණයේ සඳහන් කර තිබුනද, එය සිදුකර නොමැත.

**(B)** මෙම ගණනය කිරීම තුළ දී බොහෝ අයදුම්කරුවන්ට නිෂ්පාදනය මත සහනාධාර අඩුකල පසු වෙනත් බදු සහ නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු යන සංකල්ප දෙක කුමන ස්ථානයකදී ගැලපිය යුතුද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබුණි. ඒ පිළිබඳව අයදුම්කරුවන් විසින් මනා අවබෝධයක් ලබාගත යුතුය.

බොහෝ අයදුම්කරුවන් වෙළඳපොළ මිලට දළ දේශීය නිශ්පාදිතය, වෙළඳපොළ මිලට දළ ජාතික ආදායම බවට පරිවර්තනය කිරීමේදී විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම නිසි පරිදි ගලපා තිබුණි.

**(C)** සාර්ව ආර්ථිකයේ ප්‍රධාන අංශ 3 හඳුනාගැනීම නිවැරදිව සිදු කර ඇත්තේ සුළු පිරිසක් පමණි. බොහෝ පිරිසක් මේ සඳහා වැරදි පිළිතුරු ලියා තිබුණි. මෙය ඉතාමත් සරල ප්‍රශ්ණයක් වූ අතර පහසුවෙන් ලකුණු ලබාගත හැකිව තිබූ ප්‍රශ්ණයකි.

**(D)** සංකෝචනාත්මක හා ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අතර වෙනස ලිවීමේදී බොහෝ අයදුම්කරුවන් රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය ප්‍රතිපත්තිය අතර පටලවා ගෙන එනම්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට මූල්‍ය ප්‍රතිපත්තියේ තොරතුරු ලියා ඇත.

එමෙන්ම සංකෝචනාත්මක හා ප්‍රසාරණාත්මක ප්‍රතිපත්ති ගැන ලිවීමේදී ඒවායේ අදහස් මාරුකර ලියා තිබුණි.

මින් පැහැදිලි වන්නේ අයදුම්කරුවන්ට සංකෝචනාත්මක හා ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ගැන පැහැදිලි අවබෝධයක් නොමැති බවයි.

මෙම ප්‍රශ්ණයට, මුළු ලකුණු ප්‍රමාණයම ලබාගත්තේ අයදුම්කරුවන්ගෙන් කිහිපදෙනෙකු පමණි.

- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනිමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරිම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශිලනය කිරීම.

(5) උත්තර ලිවිමේදි මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදිමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරිමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනිම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදිමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සුදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -